**උඩපළාත ප්‍රාදේශීය සභාව - 2022**

-------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

උඩපළාත ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට උඩපළාත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණන සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේ ද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සියබලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුළ සහ අදාළ නීති, රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1 **ගිණුම්කරණ අඩුපාඩු**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා ගිණුම්වල වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරන බව | වියදම් සඳහා ගිණුම්වල ප්‍රතිපාදන ඇති කළ යුතුය. |
| (ආ) | පොදු කටයුතු සඳහා ලැබී තිබුණු රු.8,081,293 ක ඉඩම් කොටස් 03 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | ඉඩම් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයට අදාළ හිඟ කඩ කාමර කුලී රු.648,097 ක් කපා හැරීමේ දී, සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | -එම- | වර්ෂයේ වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

1.6.2 **නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වත්කම් විෂයන් 02 ක හා වගකීම් විෂයයකට අදාළ මූලික පොත්වල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේ දී රු.2,084,962 ක නොසැසඳීමක් විය. | 2023 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් හඳුනා ගෙන ගිණුම් ශේෂ නිවැරදි කළ යුතුය. |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 127 වගන්තිය | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි සුසාන භූමි 60 ක් සභාවට පවරා ගෙන නොතිබුණි. | අයිතිය පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,371,185 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,000,479 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. | ඇස්තමේන්තුගත ආදායම රු. | බිල් කළ ආදායම රු. | රැස් කළ ආදායම රු. | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය රු. |
| (i) | වරිපනම් හා බදු | 2,399,000 | 5,748,890 | 6,482,593 | 4,821,859 | 5,569,400 | 5,615,196 | 5,105,014 | 5,555,561 |
| (ii) | කුලී | 6,175,300 | 4,430,270 | 4,050,709 | 2,939,915 | 6,182,220 | 4,036,571 | 3,228,425 | 2,560,354 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 6,142,590 | 3,435,980 | 3,549,880 | 4,188,200 | 6,175,000 | 5,011,504 | 2,901,854 | 4,302,100 |
| (iv) | වෙනත් ආදායම් | 41,340,000 | 35,216,269 | 55,522,773 | 31,417,081 | 9,409,200 | 7,464,360 | 5,268,924 | 51,723,585 |
| | එකතුව | 56,056,890 | 48,831,409 | 69,605,955 | 43,367,055 | 27,335,820 | 22,127,631 | 16,504,217 | 64,141,600 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම්**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.1,663,740 ක හිඟයක් පැවති අතර, එයින් රු.5,000 ඉක්ම වූ දේපළ ඒකක 67 කින් ලැබිය යුතු ශේෂය රු.579,897 ක් විය. | හිඟ මුදල් අය කර ගැනීමට අවශ්‍ය ජංගම වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ආ) | **අක්කර බදු**<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට රු.119,125 ක හිඟ ශේෂයක් පැවති අතර, එයින් රු.3,000 ඉක්ම වූ ඒකක 06 කින් රු.30,706 ක ශේෂයක් අය කර නොතිබුණි. | හිඟ මුදල් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | හිඟ ආදායම් අය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **ජල බදු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.3,038,804 ක හිඟයක් පැවති අතර, එයින් අවුරුදු 01 ත් 05 ත් අතර රු.778,449 ක ශේෂයක් පැවතුණි. එසේම, හිඟ ශේෂයෙන් රු.5,000ට වැඩි ජල පාරිභෝගිකයින් 169 දෙනෙකුගෙන් රු.1,222,999 ක ශේෂයක් අය කර නොතිබුණි. | ඉතිරි හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | **කුලී**<br>සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.2,676,454 ක හිඟයක් පැවති අතර, එම හිඟ ශේෂයෙන් වසර 01 ත් 05 ත් අතර අය නොවී පවතින ශේෂය රු.1,003,860 ක් ද, වසර 05 ට වැඩි කාලයක් තිස්සේ අය නොවී පවතින ශේෂය රු.1,137,2377 ක් විය. | හිඟය අය කර ගැනීමට කටයුතු කරන බව හා රු.383,058 ක හිඟයක් අය කර ගත නොහැකි බව. | ගිවිසුම් ප්‍රකාරව කඩ කුලී අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | **ත්‍රීරෝද රථ බලපත්‍ර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,245,500 ක හිඟයක් පැවති අතර, එම හිඟයෙන් ත්‍රීරෝද රථ 52 කින් රු.5,000 ඉක්ම වූ එකතුව රු.312,000 ක ශේෂයක් අය කර නොතිබුණි. | -- | අතුරු ව්‍යවස්ථා අනුව ආදායම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඊ) | **දැන්වීම් පුවරු ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.4,825,190 ක දැන්වීම් පුවරු ආදායමක් අය කර නොතිබුණු අතර, ඉන් වසර 01 ත් 05 ත් අතර අය නොවී පවතින ශේෂය රු.2,942,700 ක් විය. | හිඟ ගාස්තු අය කර ගැනීම සඳහා සිහි කැඳවීම් ලිපි හා නොගෙවූ ආයතන 09 ක් සඳහා නඩු පවරා ඇති අතර, අය කර ගැනීම සඳහා නීතිමය පියවර ගැනීමට කටයුතු කරන බව. | අතුරු ව්‍යවස්ථා අනුව හිඟ ආදායම් අය කළ යුතුය. |
| 2.2.3 | **උසාවි දඩ හා මුද්දර ගාස්තු**<br>පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.10,773,010 ක් විය. | උසාවි දඩ හිඟ සම්බන්ධයෙන් ප්‍රධාන ලේකම් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | උසාවි දඩ හා මුද්දර ගාස්තු කාලීනව ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රුපියල් මිලියන 45 ක වියදමින් 2016 වර්ෂයේ දී ඉදිකර තිබුණු පුස්සැල්ලාව නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 කට නඩුවක් පැවතීම හේතුවෙන්, 2022 සැප්තැම්බර් වන විට රු.171,000 ක නඩු ගාස්තුවක් සභාවට ගෙවීමට සිදු වී තිබුණු අතර, ඊට අමතරව කඩ කාමර 14 ආරම්භයේ සිටම බදු දීමට නොහැකිව නිෂ්කාර්යයව පැවතිණි. | රු.171,000 ක නඩු ගාස්තුවක් ගෙවීමට සිදු වී ඇති බව. | ගැටළු නිරවුල් කර කඩ කාමර බදු දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පුස්සැල්ලාව කළුගලවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ අමාත්‍යාංශ රු.1,000,000 ක ප්‍රතිපාදන මත කොන්ත්‍රාත්කාර සමිතියකට පවරා රු.956,809 ක් වැය කර තිබුණි. මෙම කොන්ත්‍රාත් වටිනාකම නොගෙවීම හේතුවෙන් සමිතිය විසින් නඩු පවරා තිබුණු අතර, 2023 මාර්තු 24 දිනැති නඩු තීන්දුව අනුව කොන්ත්‍රාත්කරුට රු.956,809 ක් ගෙවීමට සිදු වී තිබුණි. මෙම මුදල අදාළ අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණු අතර, රු.79,810 ක නඩු ගාස්තු ගෙවීමට සිදුවීම හේතුවෙන් සභා අරමුදලට රු.1,036,619 ක පාඩුවක් සිදු වී තිබුණි. | නඩු තීන්දුව ලබා ගැනීමෙන් අනතුරුව නඩු ගාස්තු ලෙස ප්‍රාදේශීය සභාව වැය කර ඇති මුදල වන රු.79,810 ක මුදල සහ කොන්ත්‍රාත් වටිනාකම වන රු.956,809 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනීමට අපේක්ෂා කරන බව. | නඩු තීරණ අනුව කටයුතු කළ යුතුය. අලාභ අය කර ගත යුතුය. |
| (ඇ) | දේපළ වෙළඳ ආයතනයකින් අනුබෙදුම් කළ ඩෙල්ටාවත්ත ඉඩමේ එකතුව පර්චස් 195 ක ඉඩම් කොටස් 05 ක් පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභාවට වෙන් කර ඇති බිම් කොටස්, බිම් සවිය සහතිකයක් මඟින් පැවරීමට අවශ්‍ය කටයුතු ප්‍රයිම් ලෑන්ඩ්ස් සමාගම විසින් සිදු කර අදාළ සහතික පත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | පොදු කටයුතු සඳහා වෙන් කළ ඉඩම සඳහා ඔප්පු ලබා ගත යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.3,665,824 ක් වූ අතර, එයින් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂ එකතුව රු.1,279,657 ක් හා වසර 05 ඉක්ම වූ ශේෂය රු.614,835 ක් අය කර ගෙන නොතිබුණි. | රු.228,405 ක මුදලක් රජයේ නිවාස කුලී හිඟ මුදලකි. වසර 05 ක් ඉක්මවා ඇති ණයගැති ශේෂය අධිකරණ තීන්දුව ලබා ගැනීමෙන් පසුව අය කර ගන්නා බවත්, රු.1,746,785 ක මුදල ලබා ගැනීමට ලිපි යොමු කර ඇති බව. | ලැබිය යුතු ශේෂ අය කර ගත යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂයක එකතුව රු.7,136,457 ක් වූ අතර, එයින් වසර 01 ත් 05 ත් අතර කාලයක් ඉක්මවා තිබුණු ශේෂවල එකතුව රු.1,055,585 ක් හා වසර 05 ක් ඉක්ම වූ ශේෂය රු.532,871 ක් නිරවුල් කර නොතිබුණි. | වසර 05 ක් ඉක්ම වූ ශේෂ සම්බන්ධයෙන් නඩු කටයුත්ත අවසන් වූ පසු අය කිරීමට කටයුතු කරන බව. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කළ යුතුය. |
| (ඊ) | ප්‍රාදේශීය සභාවට පොදු කටයුතු සඳහා වෙන් කළ අක්කර 03 පර්චස් 5.91 ක ඉඩමක අනවසරයෙන් පර්චස් 24.07 ක කොටසක පුද්ගලයෙකු විසින් ස්ථිර ගොඩනැගිලි 02 ක කොටස් ඉදිකර තිබුණු අතර, පර්චස් 8.99 ක කොටසක බ්ලොක් ගලින් තාප්පයක් ඉදිකර තම පෞද්ගලික ඉඩමට යා කර ගෙන තිබුණි. රූඩ් 01 පර්චස් 9.94 ක කොටසක තවත් පුද්ගලයෙකු ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික මඩුවක් ඉදිකර තිබුණු අතර, එහි තේ වගා කර තිබුණි. ප්‍රාදේශීය සභාවට අයත් ඉඩම අනවසරයෙන් බාහිර පාර්ශවයකට අත්පත් කර ගැනීමට ඉඩ හැර තිබුණු අතර, අදාළ ඉඩම පොදු කටයුතු සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් වහාම ඉවත් කර ගන්නා ලෙස සිහි කැඳවීම් හා අවසන් නිවේදන යොමු කර ඇති අතර, රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ පනත යටතේ නීතිමය කටයුතු සිදු කිරීම සඳහා මහා සභා අනුමැතිය ලබා ගෙන ඇති බව. | අනවසර පදිංචිකරුවන් ඉවත් කර දේපළ ආරක්ෂා කළ යුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට එකතුව රු.920,000 ක ට්‍රැක්ටරයක් හා යතුරු පැදියක් 2017 හා 2020 වර්ෂවල සිට නිෂ්ක්‍රීයව පැවතුණ ද, අලුත්වැඩියා කිරීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු ට්‍රැක්ටර් රථය අලුත්වැඩියා කිරීමට ද, යතුරු පැදිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දොළුව මහජන පුස්තකාලය සඳහා CCTV කැමරා පද්ධතියක් මිලට ගැනීම සඳහා පළාත් සභාවේ ලියාපදිංචි ආයතන 04 කින් මිල ගණන් කැඳවා තිබුණ ද, ඒ පිළිබඳ සැලකිල්ලකින් තොරව 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 178(09) ට පරිබාහිරව කටයුතු කර 2022 මාර්තු 02 වන දින ලංසු නොකැඳ වූ ආයතනයකින් රු.440,500 කට CCTV කැමරා පද්ධතියක් මිලදී ගෙන තිබුණි. | 2021 වර්ෂයේ ප්‍රතිපාදන යොදා ගනිමින් සිදු කළ ද, කිසිදු මිල කියුමක් සභාවට නොලද අතර, නැවත මිල කැඳවුව ද, කිසිදු මිල කියුමක් සභාවට නොලැබුණි. වෙළඳ පොළ අර්බුදතා හේතුවෙන්, උපකරණවල හිඟය පවතින බැවින්, කැමරා සවි කිරීමට හැකියාව ඇති ආයතනයක් මිල කියුම අතින් භාර දී ඇත. ලිඛිතව මිල ගණන් කැඳවීමක් සිදු කළ නොහැකි වූ බව. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැප්ලි පාසැල් මාවතේ පාලම සංවර්ධනය කිරීම - රු.1,000,000 කර්මාන්තයන් වැය විෂයන් 03 ක ඉටු නොකළ කොටස් සඳහා සහ ඊට අදාළ ප්‍රවාහන ගාස්තු වෙනුවෙන් රු.156,634 ක අධි ගෙවීමක් සිදු කර තිබුණි. | නොකළ වැඩ සඳහා රු.156,634 ක මුදලක් ගෙවීම සම්බන්ධයෙන් කර්මාන්තය අධීක්ෂණය කළ තාක්ෂණික නිලධාරීගෙන් ලිඛිතව කරුණු විමසීමක් සිදු කළ අතර, පිළිතුරක් නොලැබීම හේතුවෙන් නොකළ වැඩ සඳහා ගෙවීම් සිදු කර ඇත්නම්, අය කර ගැනීමට පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ උපදෙස් ඉල්ලා ඇති බව. | අලාභයන් අය කිරීමට හා විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත<br>සමාලෝචිත වර්ෂය අවසානයට තනතුරු 12 ක සේවක පුරප්පාඩු 29 ක් ද, එක් තනතුරක සේවක අතිරික්තතා 16 ක් ලෙස ද පැවතුණි. | අභ්‍යාසලාභී උපාධිධාරීන් සේවාස්ථගත කිරීමේ දී සංවර්ධන නිලධාරි තනතුරෙහි අතිරික්තතා 16 ක් ඇති වී ඇති බව පුරප්පාඩු තනතුරු 29 ක් සඳහා දෛනික පදනම මත සේවකයින් 16 දෙනෙකු හා කොන්ත්‍රාත් පදනමින් නිලධාරීන් 02 ක් බඳවා ගෙන ඇති බව**.** | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතුය |
| (ආ) | සේවක ණය<br>1990 වර්ෂයේ සිට 2014 දක්වා කාල පරාසයට අදාළව සේවකයින් 10 දෙනෙකුගෙන් අය විය යුතු රු.77,883 ක හිඟ හිටි ණය ශේෂයක් ද, ඉකුත් වර්ෂයේ මිය ගිය සේවකයින් දෙදෙනෙකුගෙන් අය විය යුතු රු.273,110 ක ණය ශේෂය ද අය කර නොතිබුණි. | නිලධාරීන් 10 දෙනෙකු සම්බන්ධයෙන් ඔවුන්ගේ පෞද්ගලික තොරතුරු, ඇපකරුවන්ගේ තොරතුරු සොයාගත නොහැකිවීම මත අය කර ගැනීමේ ගැටළු පවතී | හිඟ සේවක ණය අය කර ගත යුතුය |